**ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම 2025 (2026)**

2026.03.29 දින පැවති ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත තරඟ විභාගයේ සහ 2026.09.04, 05 සහ 06 යන දිනයන්හි දී ස්වදේශ කටයුතු අංශයේදී පැවති යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ත්‍රෛමාසික පුහුණුව සඳහා කැඳවීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය මෙම වෙබ් අඩවියේ (www.moha.gov.lk) පළ කර ඇත.

02. මුලතිව් දිස්ත්‍රික්කයේ මැරිටයිම්පත්තු (4415) සහ වවුනියා දිස්ත්‍රික්කයේ වෙන්ගලචෙට්ටිකුලම් (4312) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ප්‍රතිඵල මෙම ලේඛනයෙහි ඇතුළත් නොවන අතර එම ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව මෙම වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

03. මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලේපත්තු උතුර (5103) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ ලිඛිත විභාගයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ත්‍රෛමාසික පුහුණුව සඳහා කැඳවීමට කිසිඳු අපේක්ෂකයෙක් සුදුසුකම් ලබා නොමැති බැවින් කෝරලේපත්තු උතුර (5103) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිඵල මෙම ලේඛනයේ ඇතුළත් නොවේ.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
2026 සැප්තැම්බර් මස 24 වන දින